Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School



1.2.4. “වන සතුන් නෑ

රඹීමට , වැව් ඉවුරක් අසලට ගිය දා“ (චිත්‍ර සංරචනය සම්බන්ධ පාඩම)

“දුවේ පුතේ - මේ මාතෘකාවට චිත්‍රයක් ඇඳල පාට කරන්න ඕනි. ඔයාලට එවන් සිදුවීමක් ගැන අත්දැකීමක් තිබෙනවානම් වඩාත් හොඳයි. නැතිනම් - රූපවාහිනිය හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එසේ ගිය පිරිසක් හා සතුන් දැක තිබෙන්නට අවශ්‍යයි. අඩුම තරමින් “ඩිස්කවරි“ වැනි වන සතුන්ගේ ජීවන චර්යාවන් ගවේශනය කර රූගත කරන ලද වාර්තා වැඩ සටහන් හෝ නරඹා තිබීම ඔබට වැදගත් වේවි.

එහෙම නම් - දුවේ පුතේ අපි බලමු මෙම නිර්මාණය කොහොමද කළ යුත්තේ කියලා.......................................

මුලින්ම කඩදාසි තලය  තිරස් අතට හරවා ගන්න. නරඹන පිරිස එම කඩදාසි තලයේ පහත

කොටසට වන්නට  පිටුපා - එහෙත් ඉදිරියෙන් පෙනෙන වැව දෙස බලා සිටින පරිදි යොදාගන්න.

ඊළඟට වැව හා ඇත ගොඩබිම් කොටස් - රූප අතරින් පෙනෙන සේ වන සතුන් කිහිප දෙනෙක් (මුවන් වැනි අඳින්න)



තිරස් රේඛාව/වැව් ජල මට්ටම

චිත්‍රෙය් ඉහළ කොටස් වල ඇතින් පෙනෙන ගොඩබිම් සීමාව , ජල තලයේ මට්ටම සේ අඳින ලද තිරස් රේඛාවෙන් ඉහළට ගන්න

දුවේ පුතේ දැන් මෙම චිත්‍රය වර්ණ කරන්න

එහි දී චිත්‍රෙය් පහත කොටස්වල ඇති මානව රූප හා සත්ත්ව රූප හොඳින් එළිය හා අඳුර පෙන්වමින් වඩාත් තද වර්ණ හා ලා වර්ණ යොදාලෙන පාට කරන්න. නමුත් චිත්‍රෙය් ඉහළ ඇති කොටස් හෙවත් ජලාශය හා ඈත ගොඩබිමත් ආකාශයත් ලා පැහැය ගත් වර්ණ භාවිතා කරමින් පාට කරන්න.

සැළකිය යුතුයි -:

මෙහි ඉහත යෝජනා කළ ක්‍රමය අනියාර්යය නොවේ.
ඒ වෙනුවට ඔබ කැමති වෙනත් සම්පිණ්ඩනයක් වුවත් යොදාගන්න පුළුවනි.